# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1657/3 – 2010 ජූනි 07 වැනි සඳුදා – 2010.06.07**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: 6/3/1/489.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2006/ඩබ්එස්/399.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

බස්නාහිර පළාතේ කුඹුක පත්තුවේ කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හොරණ ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ මු.පි.ක. අංක 4174 හා 2009.05.22 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1519 ක් පමණ වන ඇල්ලකන්ද නමැති ඉඩමට මායිම් :

**කැබලි අංක 01 – ඇල්ලකන්ද – ප්‍රමාණය: හෙක්. 0.1519**

උතුරට: මාර්ගය සහ කොටගල වැවිලි සමාගම හිමිකම් කියන ඇල්ලකන්ද වත්ත (මු.පි. 1355 හි කැබලි අංක 4500) (හිපි 64057); නැගෙනහිරට: කොටගල වැවිලි සමාගම හිමිකම් කියන ඇල්ලකන්ද වත්ත (මු.පි. 1355 හි කැබලි අංක 4500) (හිපි 64057); දකුණට: කොටගල වැවිලි සමාගම හිමිකම් කියන ඇල්ලකන්ද වත්ත (මු.පි. 1355 හි කැබලි අංක 4500) (හිපි 64057); බස්නාහිරට: කොටගල වැවිලි සමාගම හිමිකම් කියන ඇල්ලකන්ද වත්ත (මු.පි. 1355 හි කැබලි අංක 4500) (හිපි 64057).

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 සැප්තැම්බර් මස 14 වැනි දින පූ.භා. 10.00 ට හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2010 සැප්තැම්බර් මස 01 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

කේ. ඒ. ඩී. ආර්. නිශාන්ති ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
හොරණ.

2010 ජූනි මස 03 වැනි දින,
හොරණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

06 - 473

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය: දෙවි/ප්‍රාලේ/ඉ/3/16.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: එල්ඩී/05/2008/එන්ආර්ඩී/247.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම රජය ලබාගෙන ඇති බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගෙන ඇති ඉඩමේ විස්තර:

මාතර දිස්ත්‍රික්කයේ, දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැල්ලබඩපත්තුව බටහිර සුළු කොට්ඨාසයේ නාඔටුන්න ගමේ පිහිටි මැනුම්පති විසින් සකස් කරන ලද අංක මාර. 2441 පිඹුරේ කැබලි අංක 01 සිට 04 දක්වා වන විස්තර දැක්වෙන ඉඩම් කැබලි 04. මාතර සිට කතරගම නව දුම්රිය මාර්ග ඉදිකිරීම සඳහා.

1A – G 12938 – 360 (2010/06)

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: කරදගහගොඩැල්ල; විස්තරය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් කියන අය: වඩුගේ දයාවතී, කරදගහකොළනිය, නාඔටුන්න; ප්‍රමාණය: හෙක්. 0.0052.

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: –; විස්තරය: මාර්ගය; මුල් හිමිකම් කියන අය: රජය; ප්‍රමාණය: හෙක්. 0.0048.

03. **කැබලි අංක 03**
ඉඩමේ නම: කරදගහගොඩැල්ල; විස්තරය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් කියන අය: අබේසිංහ නෝනාහාමි, කරදගහකොළනිය, නාඔටුන්න; ප්‍රමාණය: හෙක්. 0.0145.

04. **කැබලි අංක 04**
ඉඩමේ නම: කරදගහගොඩැල්ල; විස්තරය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් කියන අය: –; ප්‍රමාණය: හෙක්. 0.0205.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 ජුලි මස 15 වැනි දින පූ. භා. 10.00 දෙවිනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2010 ජුනි මස 15 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඉරේෂා ලියනගම,
ප්‍රාදේශීය ලේකම්,
දෙවිනුවර.

2010 මැයි මස 24 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
දෙවිනුවර.

06 - 474

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.